# නූතන බන්ධනාගාර ක්‍රමය සහ සිරකරු අයිතින්

**චමික ඉඳුවර ගුරුගේ***

**"It is not the prisoners who need reformation, It is the Prisons" – Oscar Wilde**

## හඳුන්වාදීම

දහනමවන සියවසේ මුල් භාගයේදී නූතන බන්ධනාගාර ක්‍රමය ලොවට හඳුන්වාදෙන ලදි. දහසය සහ දාහත්වන සියවස් වලදී යුරෝපය තුල බන්ධනාගාර පැවතියද දඬුවමක් වශයෙන් බන්ධනාගාරගත කිරීමක් එකල දක්නට නොවීය, ඒ වෙනුවට වැඩි වශයෙන් බන්ධනාගාර භාවිතා වූයේ නඩු විභාගය අවසන් වන තුරු සැකකරුවන් සහ චූදිතයන් රඳවා තබා ගැනීමේ කාර්යයටය.

නූතන බන්ධනාගාර ක්‍රමය බිහිවීමට බලපානු ලැබූ ප්‍රධානතම සාධක කීහිපයක් වූයේ එවකට පැවති බන්ධනාගාර තුළ මූලික අවශ්‍යතාවල හිඟකම මෙන්ම බන්ධනාගාර තුළ සිදුවන නොයෙකුත් වදහිංසා මගින් ඇතිවන මානසික පීඩාවන් හමුවේ දිනෙන් දින වැඩිවන සිරකරුවන්ගේ සියදිවි නසා ගැනීම්, මානසික විකෘතිභාවයන්ට පත්වීම් සහ ප්‍රකෝපකාරී හැසිරීම් යන ආදියයි.

මෙයට විසඳුමක් වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය වැනි රටවල් එක්ව මෙම නූතන බන්ධනාගාර ක්‍රමයහඳුන්වා දෙන ලදී. මේ හරහා සිරකරුවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන් පුනරුත්තාපනය වැනි ක්‍රියාවලීන්ට භාජනයකර සිරකරුවන්ගේ ශාරීරික මෙන්ම මානසික සෞඛ්‍ය මට්ටම් ඉහල තත්වයක පවත්වා ගැනීම සහ එහි තවත් එක් පැතිකඩයක් ලෙසට ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම කෙරෙහිද සුවිශේෂ අවධානයක්ද යොමු විය.

## බන්ධනාගාරගත කිරීමේ අරමුණු

සමාජයට තර්ජනාත්මක පුද්ගලයින් යම් කාල සීමාවකට හෝ ජීවිතාන්තය දක්වා සමාජයෙන් දුරස් කොට තැබීම බන්ධනාගාරගත කිරීමේ මූලික අරමුණයි, මෙමගින් මූලිකවම බලාපොරොත්තු වනුයේ සමාජ ආරක්ෂාව තහවුරු කර ගැනීමයි. ඇතැමුන් මෙයට වෙනස් මතයක් දරයි, එනම් දීර්ඝ කාලයක් සිරගතව සිටි තැනැත්තෙකු සමාජයට නැවත මුදා හැරීමත් සමගම ඔහු පෙරටත් වඩා දරුණු අයෙකු ලෙසට ක්‍රියා කිරීමට හැකියාවක් පවතින බවයි.

මීට අමතරව පොදු නිවර්තනය (General deterrence), මෙහිදී සිදුවනුයේ සමාජයේ අනෙකුත් පුරවැසියන්ට පණිවුඩයක් ලබා දීමයි, එනම් ඔවුන්ද එවැනි වැරදි ක්‍රියාවක නිරත වුවහොත් ඔවුනටද එවන් දඬුවමක් අත්විඳීමට සිදුවන බවයි. නමුත් මෙය එක් එක් පුද්ගලයාගේ තර්කන හැකියාව මත රඳා පවතී, මන්ද අපරාධකරුවෙකු වරදක් කළ පසු ඔහුට මුහුණපෑමට සිදුවන ප්‍රතිවිපාක පිළිබඳ සිතීමට තරම් අවබෝධයකින් යුතු පුද්ගලයෙකු නම් ඔවුන් අපරාධ කිරීමට පෙළඹේද යන්න ප්‍රශ්න සහගතය. තවද මෙය පුද්ගල නිවර්තනය (Individual deterrence) ලෙසටද ක්‍රියාත්මක වෙයි. මෙමගින් වරදකරුද නැවත එවැනිම වරදක් සිදුනොකිරීමට ඔහුට ලබාදෙන අවවාදයක් ලෙසටද ක්‍රියා කරයි.

එසේම දඬුවමක් (Punishment) වශයෙන් මෙන්ම , ප්‍රතිවිපාකයක් (Retribution) ලෙසටද බන්ධනාගාරගත කිරීම ක්‍රියාත්මක වෙයි. මෙමගින් පුරවැසියන් විසින් නීතිය සියතට

*ආධුනික වසර, ශ්‍රී ලංකා නීතිවිද්‍යාලය,
LL.B (Hons) (London),LLM(UK-Pursue)

MANURAWA2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

ගෙන නොගැළපෙන ක්‍රමවේද මගින් පලිගැනීමට පෙළඹීම වැලකෙයි.

එංගලන්තයේ විසූ සුප්‍රකට නීතිවේදියෙකු වූ ජෝන් ඔස්ටින්ගේ මතවාදය වූයේ නීතිය දඬුවම හා සම්බන්ධ කර දැක්වීමයි. ඔස්ටින්ට අනුව නීතිය ක්‍රියාත්මක කිරීමේ බලවේගය දඬුවමයි. මිනිසුන් නීතියට ගරු කරනුයේද දඬුවමට ඇති බිය නිසා බව ඔස්ටින් පවසයි. නීතිරීති කඩ කරන සෑම කෙනෙකුටම දඬුවම් නොලැබුනද දඬුවම් ලැබූවන් ගැන දකින - අසන අය තුළ නීතිය කෙරෙහි බියක් ඇතිවේ.

කෙසේ නමුත් තාඕවාදයේ නිර්මාතෘ ලෙස සැලකෙන ලඕට්සේ පඬිවරයා විසින් තාඕතේවිං නම් මූල ග්‍රන්ථයේ දක්වා ඇති පරිදි දඬුවම් වැඩිකිරීමෙන් අපරාධ අඩුවන්නේ යැයි රීතියක් නොමැත. දඬුවම් වැඩි කිරීමෙන් සිදුවනුයේ මිනිසුන් ජීවිතයට ඇති ඇල්ම දුරුලීමය, එහි ප්‍රතිඵලය වනුයේ මිනිසුන් තව තවත් බරපතල අපරාධ කිරීමට පෙළඹීමයි.

එසේම බන්ධනාගාරගත කිරීමේ තවත් වැදගත් අරමුණක් වනුයේ පුනරුත්තාපනයයි (Rehabilitation).එනම් බන්ධනාගාරගත වූවන් නැවත සමාජයට යහපත් පුරවැසියන් පිරිසක් ලෙසට මුදාහැරීමට කටයුතු කිරීමේ ක්‍රියාවලියයි. මෙහිදී ප්‍රධාන වශයෙන් සිදුවනුයේ උපදේශන සේවා, අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණුව, ක්‍රීඩා, කලා කටයුතු සහ ආගමික කටයුතු වෙත රැඳවියන් යොමු කරවීමයි. මෙමගින් සමාජයේ සුරක්ෂිතභාවය තහවුරුවන අතර සිරකරුවන්ගේ අනාගතයද යහපත් එකක් බවට පත්කෙරෙයි.

කෙසේ නමුත් ප්‍රයෝගිකව ගත් කළ බන්ධනාගාරගත රැඳවියෙකුට බන්ධනාගාර තුළදී වඩා දරුණු අපරාධකරුවන් සමග ගණුදෙනු කිරීමට ඉඩ ප්‍රස්ථාව උදා වෙයි. එමගින් ඉතා සූක්ෂම ක්‍රම භාවිතයෙන් අපරාධ කිරීමට ඉගෙන ගනී, එමනිසා අපරාධ ප්‍රමාණයද ඉහළ යන අතර නැවත ඔවුන්ව නීතියේ රැහැනට හසු කර ගැනීම වඩා අපහසු වෙයි.

## බන්ධනාගාර වර්ග සහ රැඳවියන් පිලිබඳ දත්ත

බන්ධනාගාර වර්ගීකරණයට අනුව ලොව පුරා බන්ධනාගාර 12ක් පමණ ප්‍රධාන වශයෙන් හදුනාගෙන ඇත, වඩා බරපතල අපරාධකරුවන් රඳවා ඇති සාම්ප්‍රදායික බන්ධනාගරවල සිට කෙටි කාලීන දඬුවම් ලද වරදකරුවන් සදහා වූ තාප්පවලින් වට නොවූ එළිමහන් කඳවුරු දක්වා වූ ආයතන ධූරාවලියක් මේ තුළ දක්නට ලැබෙයි. මෙම එක් එක් වර්ගය තුළ ඒවාටම ආවේණික වූ ලක්ෂණ, හර පද්ධතීන් සහ ක්‍රමවේදයන් රාශියක් පැහැදිලිව වෙන් කොට හදුනාගත හැකිය.

වර්ෂ 1844 අංක 18 දරණ ආඥා පනත[1] මගින් ශ්‍රී ලංකාව තුළ බන්ධනාගාර දෙපාර්තුමේන්තුව ස්ථාපනය කරන ලදි. නමුත් එකල එය පොලිස් දෙපාර්තුමේන්තුව යටතේ ක්‍රියාත්මක විය. අද වන විට බන්ධනාගාර දෙපාර්තුමේන්තුව යටතේ දීපව්‍යාප්තව බන්ධනාගාර 23 ක් පවතී.

වර්ෂ 1979 දී හඳුන්වාදුන් එළිමහන් කඳවුරු ක්‍රමය හරහා බන්ධනාගාර තුළ පවතින තදබදය අවම කිරීමටත්, සුලු වැරදි සඳහා බන්ධනාගාර ගතවූවන් දරුණු අපරාධකරුවන් සමග එක් වීමද පාලනය කිරීමට හැකිවෙයි. මෙයට අමතරව නියම කරන ලද දඬුවමෙන් හතරෙන් එකක ප්‍රමාණයක් ගෙවා තවත් වසර දෙකකට අඩු කාලයක් සිරගතව සිටීමට නියමිත සතුටුදායක හැසිරීමක් ඇති රැඳවියන්ද මෙලෙස එළිමහන් කඳවුරු වෙතට යොමු කරයි.

එසේම සිරකරුවන් නැවත සමාජානුගතවීම උදෙසා නිවාඩු සහ වැඩ සදහා මුදා හැරීම මුල්වරට වර්ෂ 1979 දී හඳුන්වාදෙන ලදි.
ඒ අනුව දීර්ඝකාලීන සිරකරුවන්ට හයමසකට වරක් තම නිවසට ගොස් නැවත පැමිණීමට හැකිවෙයි. එසේම තෝරාගන්නා ලද සිරකරුවන්ට රැකියා ලබා දී ඒ සදහා පිටත්ව ගොස් නැවත පැමිණීමටද අවස්ථාව ලබා දෙයි.

[1] First Prison Ordinance was enacted, entitled "An Ordinance for the better regulation of Prisons Act No. 18 of 1844", Establishment of Welikada Prison.

MANURAWA 2020

©All rights reserved

බාලවයස්කාර රැඳවියන් විශේෂ විධිවිධාන යටතේ පරිවාස ආයතන වෙත යොමුකර ඔවුන්ට වෘත්තිය පුහුණුව ලබාදීම සිදු කරයි. ඒ අතර ඇතැම් වරදකරුවන් විශෝධන ආයතන කරා යොමු කරයි.

වර්ෂ 2018 නිකුත්කල සංඛ්‍යාලේඛනයන්ට අනුව [2] එම බන්ධනාගාර තුළ සමස්තයක් ලෙසට රැඳවියන් 133,115ආසන්න ප්‍රමාණයක් රඳවා තබා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ තත්වය එසේ පවතින අතර ලොව පුරා සමස්ත ජනගහනයෙන් 22%ක ප්‍රතිශතයක්[3] බන්ධනාගාරගතව සිටියි, මෙය සමස්ත ලෝක ජනගහනයන් පහෙන් එකක පමණ පිරිසකි. එම නිසා මෙම රැඳවියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රමුඛ අවධානයක් යොමු විය යුතුමය. ඔවුන්ගේ අයිතීන් පිළිබඳ හඬක් නැගීමට ලොව පුරා මානව අයිතීන් සුරකීමෙහිලා කටයුතු කරන සංවිධාන පෙරට පැමිණි කටයුතු කළ යුතුය.

## සිරකරුවන් සතු අයිතීන්වල ස්වභාවය

මානව හිමිකම් යන්න නූතන සංකල්පයක් වුවද එහි වැදගත්කම මානව ඉතිහාසය මෙන්ම පැරණිය. අද වන විට මෙම අයිතීන් බොහෝමයක් රටවල් ගනනාවක්ම විසින් මූලික අයිතීන් වශයෙන් පිලිගෙන ඒ එක් එක් රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් සුරක්ෂිත කොට ඇත. සැබවින්ම සිරකරුවන්ට අයිතීන් තිබේද? එසේ තිබේනම් ඒ මොනවාද? එම අයිතීන් ප්‍රමාණවත්ද? ඔවුන් එලෙස අයිතීන් ලැබීමට සුදුසුද? එකී අයිතීන් සුරැකීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද? ඒවායේ ප්‍රගතිය කවරේද? යන ආදී ගැටලු රාශියක් අප හමුවේ පැන නගී.

සාමාන්‍ය පුරවැසියෙකු හා සිරකරුවෙකුට සමාන අයිතිවාසිකම් නොමැත. ඔවුන් සතු අයිතීන් සීමිතිය, අල්පය. එලෙස ඔවුන්ගේ අයිතීන් සීමා කිරිම යම් ආකාරයකට සාධාරණ වෙයි. නමුත් අනෙක් අතට ඒ හරහා සිරකරුවන්ට මුහුණ දීමට සිදුවන කටුක අත්දැකීම් රාශියක්ද පවතී. මේ ආකාරයට ඇතැම් අයිතීන් ඔවුනට අහිමිවීම නිසා නූතන බන්ධනාගාර ක්‍රමය හරහා බලාපොරොත්තුවන ඉලක්ක සපුරාගත හැකිද යන්න ගැටලු සහගතය.

කෲර සහ අමානුෂික වධ හිංසාවන්ට ලක් නොවීමට ඇතිඅයිතිය, සර්ව සාධාරණත්වයේ අයිතිය වැනි අයිතීන් කීපයක රැකවරණය සිරකරුවන්ටද හිමිය. මෙය ඔවුනට මහත් අස්වැසිල්ලකි, මන්ද මෙවැනි අයිතීන් හරහා බන්ධනාගාරය තුළදී කුමන තරාතිරමක පුද්ගලයෙකුටද වුවද එක සමාන ලෙසට සලකනු ලැබෙයි. තවද තමාගේ නිර්වද්‍යතාවය තහවුරු කිරීමට අවශ්‍ය නීතිමය ආධාර ලබා ගැනීමටද මෙමගින් අවකාශය උදා වෙයි.

ජාත්‍යන්තර මට්ටමේ ක්‍රියාත්මක මානව හිමිකම් සුරැකීමේ සංවිධාන මෙන්ම ශ්‍රී ලංකාව තුළද මානව හිමිකම් කොමිෂන් සභාව වැනි ආයතන හරහා රැඳවියන්ගේ අයිතීන් සුරකීමෙහිලා නිති පියවර ගනු ලබයි. වර්ෂ 2016 දී මෙරටට පැමිණි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිතවරයෙක් වන ජුආන් මෙන්ඩෙස් මහතා[4] විසින් එවකට බන්ධනාගාර තුළරැඳවියන් රඳවා තබා ගැනීමට තරම් ඉඩකඩ නොමැති බවත් රැඳවියන්ට ප්‍රමාණවත් තරම් වාතාශ්‍රය, නිදාගැනීමට අවශ්‍ය අවම පහසුකම් පවා නොමැතිකම සහ සිරමැදිරි තුළ පවතින අධික උණුසුම ආදී කරුණු පිළිබඳව දැඩිව විවේචනයට ලක් කර ඇත.

ඔහු තවදුරටත් අණාවරණය කර තිබුණේ ඇතැම් බන්ධනාගාර තුළ රඳවා තබා ගැනීමට හැකි ධාරිතාව මෙන් 200% - 300% වැනි

[2] http://www.prisons.gov.lk/Statistics/Statistics-2019.pdf

[3] World Prison Population List twelfth edition Roy Walmsley

[4] https://www.humanrightscommission.vic.gov.au/the-law/item/918-human-rights-and-the-prison-system

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

අගයයන් ඉක්මවාරුදවියන් සිටින අතර ඇතැම් රුදවියන් පඩිපෙල් මත නිදාගෙන සිටි බවත්, එක් රුදවියෙකු වෙනුවෙන් වෙන් කර ඇති සිරමැදිරි තුළ රුදවියන් 4-5 අතර පිරිසක් රදවා සිටි බවයි.

මෙහිදී ඔහු විසින් යෝජනා කරන ලද්දේ සෑම බන්ධනාගාරයක් තුළම දුරකතන ඒකකයක් පිහිටුවන ලෙසත් ඒ හරහා බන්ධනාගාර තුළ අනවසරයෙන් ජංගම දුරකතන භාවිතය අවම වන බවත්, එමගින් සිදුවන අපරාධද අවම කරගත හැකි බවයි. එසේම රුදවියන්ට නිසි අධීක්ෂණය යටතේ තම සමීපතයන් සමග සබදතා පවත්වා ගැනීමටද ඉඩ ප්‍රස්තාව මේ හරහා උදා වෙයි. මෙය යම් ආකාරයකට ඔවුන්ගේ මානසික ආතතිය අවම කර ගැනීමට පිටිවහලක් වෙයි.

මේ හරහා අපට මොනවටට පෙනී යන්නේ සියවසකට අධික කාලයක් ගතව තිබුණද නූතන බන්ධනාගාර ක්‍රමවේදය ඔස්සේ සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වන ලද අරමුණු තවමත් ලගාකර ගැනීමට අපොහොසත් වී ඇති බවයි.

## බන්ධනාගාර නිලධාරීන්ගේ කාර්යභාරය

බන්ධනාගාර නිලධාරීන්ට පැවරී ඇති රාජකාරිය අතිශය වැදගත් එකක් වෙයි. මන්දයත් ඔවුනට සිය රාජකාරිය ඉටුකිරීමට සිදුවනුයේ නීතිය මගින්ම අයිතීන් සීමාකර සිරගත කොට ඇති පිරිසක් සමගයි. ඔවුනගේ වගකීම වනුයේ එකී පිරිස සුරක්ෂිතව රැක බලාගෙන නැවත යහපත් පුරවැසියෙකු ලෙස සමාජයට මුදා හැරීමයි. මෙය අතිශය වැදගත් වූත් අනෙක් අතට අතිශය පීඩාකාරී වූත් සමාජයේ යහපත උදෙසාම කරනු ලබන කාර්යයකි.

එසේ නමුදු ලෝකයේ බොහෝ රටවල බන්ධනාගාර නිලධාරීන් ඒ උදෙසා නිසි පුහුණුවකට ලක් නොවන අතරම ඔවුනට ලබා දෙන වැටුපද ප්‍රමාණවත් නොවෙයි. එසේම ඔවුනට සමාජය තුළ හිමිවන පිලිගැනීමද සෑහීමකට පත් විය නොහැකිය.

මෙලෙස බන්ධනාගාර නිලධාරීන් නිසි පුහුණුවකට ලක් නොකිරීම මෙන්ම රුදවියන්ට ඇති අයිතීන්ගේ ස්වභාවය පිලිබද ඔවුනට ඇති අනවබෝධය හේතුවෙන් අවසානයේ සිදුවනුයේ රුදවියන්ගේ අයිතීන් උල්ලංඝනයට ලක් වීමයි.

මානව හිමිකම් පිලිබද විශ්ව ප්‍රඥප්තිය මගින් රුදවියන්ගේ අයිතීන් සුරකීමෙහිලා අවැසි අවම රීතීන් කීපයක් හදුන්වා දී ඇත. මෙයට බන්ධනාගාර නිලධාරීන් සිය රාජකාරිය ඉටු කිරීමේදී අනුගමනය කල යුතු ප්‍රතිපත්තීන් කීපයක්ද පෙන්වා දී ඇත. මේවා අතිශය මානුෂීය මෙන්ම විනයානුකූල ලෙසට සකස් කරන ලද ඒවාය, මෙම ප්‍රතිපත්තීන් දෛනික රාජකාරී කටයුතුවලට එක් කර ගැනීම හරහා බන්ධනාගාර නිලධාරීන්ගේ සේවාව උසස් මට්ටමක් කරා නගා සිටුවිය හැකි වෙයි, එමගින් ඔවුන්ට සමාජය තුළ ඔවුන්ට හිමිවන පිලිගැනීමද වැඩි වෙයි.

එලෙස හදුන්වා දී ඇති ප්‍රතිපත්තීන් වර්ෂ 1955 ජිනිවා නුවරදී පැවති වරදකරුවන්ට එරෙහිව සිදුවන අපරාධ සහ කෲර වදහිංසනයන් වැලක්වීම උදෙසා වූ එක්සත් ජාතීන්ගේ කොංග්‍රසය විසින් පළමුව නිර්දේශ කොට එය පසුව එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජීය කවුන්සලය විසින් අනුමත කරන ලදි. පසුව වර්ෂ 1988 දීමෙම ප්‍රතිපත්තීන් එක්සත් ජාතීන්ගේ ප්‍රධාන සැසිවාරයේදී සාමාජික රටවල් මගින් පිලිගන්නා ලදි. මෙය ප්‍රධාන වශයෙන් කරුණු එකොලහකින් සමන්විත වෙයි.

එම කරුණු එකොළහ අතරට සියලු රුදවියන්ට එකලෙෂ මානුෂියව සැලකීම, රුදවියන්ට බාහිර ලෝකය සමග ගණුදෙනු කිරීමට ඇති අයිතිය, රුදවියන්ගේ සෞඛ්‍යයට අදාල ප්‍රතිපත්තීන් මෙන්ම රුදවියන් වෙන් කොට රුදවීම, ඔවුන් කාණ්ඩ කිරීම සහ ආගමික, සංස්කෘතික කටයුතු කෙරෙහි රුදවියන් යොමු කරවීම ආදීය අයත් වෙයි.

## ජාත්‍යන්තර නීතිය සහ සිරකරු අයිතීන්

ජාත්‍යන්තර නීතියේ ප්‍රඥප්තීන් සහ නීති සමුදායන් අනුව මානව හිමිකම් යනු මිනිසෙකුට

©All rights reserved

සිය උපතින්ම උරුමවන අයිතීන් වෙයි. වර්ෂ 1215 දී එංගලන්තයේදී ස්ථාපිත මැග්නාකාර්ටා ගිවිසුම මගින් එකළ එංගලන්තයේ රජු සහ වංශාධිපති රදළයන් අතර එකගතාවයන් කීපයකට එළඹුණි.

ඒ අනුව අත්තනෝමතිකව සිරභාරයට ගැනීම, නඩු විභාගයකින් තොරව සිරගත කර තැබීම සහ දඩුවම් නියම කිරීම ආදී ක්‍රියාවන් නොකිරීමට එංගලන්ත රජය එරට වංශාධිපතීන් සමග ගිවිසුම් ගත වුණි. ඉන්පසුව ඇති වූ ප්‍රංශ විප්ලවය, සහ ඇමරිකානු නිදහස් සටන, ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ වැදගත් පරිණාමීය සිදුවීම් වෙයි.

දෙවන ලෝක යුධ සංග්‍රමාය සමයේ හිට්ලර් විසින් හැට දෙලක්ෂයක පිරිසක් වධවේදනාවන්ට ලක් කොට මරා දැමීම ආදී මානව හිමිකම් උල්ලංඝණය වීමේ සිදුවීම් රාශියක් නිසාවෙන් ජාත්‍යන්තර නීතිය තුළ මානව හිමිකම් සුරකීමෙහිලා වැඩි අවධානයක් යොමු විය. එහි එක් පියවරක් වශයෙන් සිර කරුවන්ට හිමි විය යුතු අයිතීන් සම්බන්ධයෙන් ද අවධානයට ලක් විය. ඒ හරහා එකී අයිතීන්ට එතෙක් හිමිව නොතිබූ නෛතික ස්වාභාවයක් ලබාදීම ද සිදු විය .මෙම අයිතීන් බොහෝමයක් නොයෙකුත් ජාත්‍යන්තර සම්මුතීන්, ජාත්‍යන්තර යෝජනා ආදී මූලාශ්‍රවල සඳහන් වෙයි. මෙම සම්මුතීන් සහ යෝජනා මගින් සිරකැවන්ට අදාලව පැවතිය යුතු අවම ප්‍රමිතීන්, වාරණ, මෙන්ම බන්ධනාගාර තුළ පැවතිය යුතු තත්වයන් ආදිය කෙරෙහි විශේෂ සැලකිල්ලක් යොමු කර ඇත.

කෙසේ නමුත් ජාත්‍යන්තර ප්‍රජාව තුළ මෙවන් සාධනීය පියවර රාශීයක් ගෙන තිබුණද එක් එක් රටවල් විසින් එවැනි සම්මුතීන් සහ යෝජනා කෙරෙහි දක්වා ඇති ප්‍රතිචාරය එතරම් යහපත් නොවෙයි. මන්දයත් දිනෙන් දින සිරකරුවන්ගේ අයිතීන් උල්ලංඝනය වීම පිළිබඳව තොරතුරු නිරන්තරයෙන් අපට අසන්නට දකින්නට ලැබෙන නිසාවෙනි.

මෙයට කදිම නිදසුනක් ලෙස American Civil Liberties Union/ Human Rights Watch Report, Human Rights Violations in the United States [5]වාර්තාව පෙන්වා දිය හැකිය. එහිදී නූතන බන්ධනාගාර ක්‍රමය ලොවට හඳුන්වාදීමට පුරෝගාමී මෙහවරක් ඉටු කළ ඇමරිකා එක්සත් ජනපදය විසින්ම අතිශය බරපතල ලෙසට සිරකරු අයිතීන් උල්ලංඝණය කරමින් ක්‍රියාකර ඇති බවට කරුණු සඳහන් වෙයි. බන්ධනාගාර තුළ අතිවාසය (Overcrowded) ,සිරකරුවන්ට සිදුවන නොයෙකුත් හිංසනයන් සහ ඒවා අවම කිරීමට පියවර නොගැනීම, කාන්තා රැඳවියන් විසින් මුහුණ පාන නොයෙකුත් දුෂ්කරතා ආදී කරුණු රාශියක් එහිලා සඳහන් වෙයි.

වර්ෂ 1945 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වාදුන් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 55වන වගන්තිය අනුව ආගම, ජාතිය, වර්ගය, ස්ත්‍රී පුරුෂ බව, භාෂාව ආදී කරුණු කෙරෙහි අවධානයට ලක් නොකර සියලුම දෙනාට එක ලෙස සලකා ඔවුන්ගේ අයිතීන් සුරකිය යුතු බවට පෙන්වා දී ඇත.
එසේම එහි 5වන වගන්තියට අනුව කිසිදු පුද්ගලයෙකු කිසිදු ආකාරයක වද හිංසනයට ලක්කිරීමට, දඩුවම් පැමිණවීමට හැකියාවක් නොපවතින බවද පෙන්වා දී ඇත. මෙම අයිතිය ජාත්‍යන්තර සම්මුතීන් සහ ජාත්‍යන්තර යෝජනා රාශියකම සඳහන්ව පවතී.

වර්ෂ 1949 දී පිහිටුවාගත් ජිනීවා සම්මුතිය මගින් යුධ නීතීන් සම්බන්ධ එකගතාවන් රාශියකට එළඹුණි. මෙහි එක් විශේෂත්වයක් නම් සිරකරුවන්ගේ අයිතීන් සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරමින් නිමැවුණු පළමු සම්මුතිය ලෙසට ජිනීවා සම්මුතිය පෙන්වා දිය හැකිය. මන්දයත් ජිනිවා සම්මුතියේ විශේෂයෙන්ම සඳහන් කර ඇති කරුණක් නම් එහි සඳහන් අයිතීන් සහ සුරක්ෂිතභාවයන් සිරකරුවන්ටද හිමිවිය යුතු බවයි. ඒ අනුව යුද්ධයකදී සිරකරුවන්ට මානුෂීයව සැලකිය යුතු

[5]HUMAN RIGHTS WATCH, THE HUMAN RIGHTS WATCH GLOBAL REPORT ON PRISONS xV (1993). 2. H

MANURAWA 2020

බවට විශේෂයෙන්ම අවධාරණය කර ඇත. කෙසේ නමුත් මෙම අයිතීන් යුධ සිරකරුවන්ට පමණක් සීමා සහිත විය.

නමුත් පසුකාලීනව ඇතිවූ ජාත්‍යන්තර සම්මුතීන් සහ යෝජනා කිහිපයක් මගින්ම පොදුවේ සිරකරුවන්ගේ අයිතීන් කෙරෙහි වැඩිමනක් අවධානය යොමු කරමින් නිර්මාණය වනු දක්නට ලැබීය. ඒ අතර ඇතැම් ඒවා හුදෙක්ම සිරකරුවන්ගේ අයිතීන් උදෙසාම නිර්මිත ඒවා විය. කෙසේ නමුත් එකී බොහෝමයක් සම්මුතීන් සහ යෝජනා තුළ දක්නට වූ අඩුපාඩුවක් වූයේ කෲරත්වය (Cruelty), අමානුෂිකත්වය (Inhumanity), පහත් කොට සැලකීම (Degrading) ආදී වචන නිසි පරිදි අරුත්ගන්වා නොතිබීමයි. [6]මේ හරහා එක් එක් සාමාජික රටවල් තම අභිමතය පරිදි එකී වචන අරුත්ගැන්වීම සිදු කරන ලදි.

ජාත්‍යන්තර නීතියට මගින් බලහත්කාරයෙන් සේවයේ යෙදවීම, කෲර වදහිංසනයට ලක් කිරීම ආදී ක්‍රියා වැලක්වීමේ අරමුණින් සිරකරුවන්ගේ අයිතීන් සුරැකීම වෙනුවෙන් පියවර රාශියක් ගෙන ඇත. දහඅටවන සියවසේ අගභාගයේදී නූතන බන්ධනාගාර ක්‍රමයට පෙර බන්ධනාගාර සලකනු ලැබුවේ රාජ්‍යය දේපලක් ලෙසටය ( State Property ), එම නිසා බන්ධනාගාර ගතවූවන්ට සලකනු ලැබුවේ වහල්ලන් ලෙසටය. මෙලෙස ඔවුන්ට අමානුෂිකව සැලකීම හරහා ඔවුන්ගේ අයිතීන් බොහෝ සෙයින් උල්ලංඝනයට ලක් විය. එකල අධිකරණ පද්ධතීන් තුළ සහ නීති රීතිවල පැවති අඩුපාඩු ද මෙයට සෘජුවම බලපාන ලදි. එනම් මේ ආකාරයට ඔවුන්ගේ අයිතීන් සීමා කිරීමට ලක් කිරීම වරදකරුවෙකුට ලබාදෙනු ලබන දඬුවමේම කොටසක් ලෙසට එකළ අධිකරණය මගින් සලකන ලදි.

UDHR[7], ICCPR[8], CAT [9]සහ ICESR[10]ආදී ජාත්‍යන්තර සම්මුතීන් සහ ජාත්‍යන්තර යෝජනා රාශියක් මගින් බලහත්කාරයෙන් සේවයේ යෙදවීම ( Forced Labour ) වැලක්වීම අයිතිය සුරක්ෂිත කිරීම උදෙසා නොයෙකුත් ක්‍රියා මාර්ග ගෙන ඇත. එසේම ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) වැනි සංවිධාන හරහාද එම අයිතිය තවදුරටත් සුරක්ෂිත කිරීමට කටයුතු කරයි.

නමුදු මෙම අයිතිය සිරකරුවන්ට හිමිද යන්න ප්‍රශ්න සහගතය. උදාහරණයක් ලෙසට අධිකරණයක් විසින් වරදකරුවෙකුට එරෙහිව බරපතල වැඩඇතිව පණවනු ලබන සිර දඬුවම් (Rigorous imprisonment)මෙම අයිතියට යටත් නොවේද යන්න යමෙකුට නැගිය හැකි තර්කයක් වෙයි. ජාත්‍යන්තර නීතියට අනුව එලෙස අධිකරණයකට දඬුවම් පැමිණවීට හැකියාවක් පවතී. මේ පිළිබඳව ICCPR පනතේ 8(b) වගන්තියේ පැහැදිලිව සඳහන් කර ඇත.

කෙසේ නමුත් එකී දඬුවම් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව, බලහත්කාරයෙන් සේවයේ යෙදවීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ සඳහන් වෙයි. එයට අනුව එය ක්‍රියාත්මක කළ යුත්තේ පොදු අධිකාරියක මග පෙන්වීම සහ අධීක්ෂණය යටතේය. එසේම සිරකරුවන් කුලී පදනම යටතේ සේවයේ යෙදවීම, පුද්ගලික අංශයේ ආයතනවල හෝ පෞද්ගලික

MANURAWA 2020

[6] Rights of Prisoners under International Law: Rights against Forced Labour; Ill Treatments or Punishments; and Right to Work and Receive Wages Ibrahim Danjuma,* Rohaida Nordin** and Mohd Munzil Muhamad***

[7] Adopted by the United Nations General Assembly by Resolution No 217A(III) of December 10, 1948

[8] International Covenant on Civil and Political Rights (adopted on December 16, 1966 and entered into force March 23, 1976).

[9] The Convention Against Torture and Other Cruel, Inhuman or Degrading Treatment or Punishment

[10] The ICESCR was adopted and opened for signature, accession and ratification by General Assembly Resolution No 2200A(XXI) of December 16, 1966 and entered into force on March 3, 1976, in accordance with Article 27 of the ICESCR

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

කටයුත්තක් සදහා යෙදවීම සිදු නොකළ යුතුය.[11]එසේම එහි 2(1) වගන්තියට අනුව,

“All work or service which is exacted from any person under the menace of any penalty and for which the said person has not offered himself voluntarily”.[12]

එනම් කිසිදු පුද්ගලයෙකු ස්වකැමැත්තෙන් තොරව දඩුවමක් ලෙසට හෝ බලහත්කාරයෙන් සේවයේ යෙදවීම කළ නොහැකිය. යුරෝපීය මානව හිමිකම් පිළිබද අධිකරණයේ (ECHR), නඩු තීන්දුවක්වන ***Van der Mussele v Belgium***[13]නඩුවේදී ස්වකීය කැමැත්ත යන යෙදුම පැහැදිළි කර දක්වා ඇත. තවද එම නඩු තීන්දුව පරිදි, යම් තැනැත්තෙකු මුලදී සිය කැමැත්ත ප්‍රකාශ කර පසුව එය ඉවත් කර ගැනීමට ඔහුට අයිතියක් ඇති බවටද වැඩිදුරටත් සදහන් වෙයි.

ජාත්‍යන්තර නීතිය තුළ තවත් වැඩි අවධානයට යොමු වී ඇති අයිතියක් නම් කෲර, අමානුෂික සැලකීම හෝ දඩුවම් පැමිණවීමට එරෙහි අයිතියයි. මේ පිළිබදව UDHR විශ්ව ප්‍රකාශනයේ 5වන වගන්තියේ පැහැදිව සදහන් කර ඇත.

No one shall be subjected to torture or to cruel, inhuman or degrading treatment or punishment.

එයට අනුව කිසිදු පුද්ගලයෙකු එලෙස වදහිංසනයට ලක් කිරීමට හැකියාවක් නොපවතී. ඒ අනුව සිරකරුවන්ටද මෙම අයිතිය මගින් රැකවරණය හිමිවේ. මෙයට සමානම රැකවරණයක් ICCPR සම්මුතිය තුළද, CAT සම්මුතියේ 16(1) වගන්තිය තුළද දැකගත හැකිවේ.

UDHR විශ්ව ප්‍රකාශනයේ 1වන සහ 2වන වගන්තිවල සදහන් පරිදි, “All human beings are equal” එනම් සියලුම මිනිසුන් එකලෙස සලකා කටයුතු කළ යුතුවෙයි. කිසිදු පදනමක් මත ඔවුන් වෙන් කොට සැලකීම සිදු නොකළ යුතුය. යමෙකු සිරගත වූ පමණින් ඔහු හෝ ඇයගේ පුරවැසිභාවය අහිමි වීමක් සිදු නොවෙයි.

එසේ හෙයින් රැදවියන්ටද ලැබිය යුතු අයිතීන් හැකිතාක් දුරට සුරක්ෂිත කිරීමට එක් එක් සමාජික රටවල් විසින් වග බලා ගත යුතුය. එසේම ජාත්‍යන්තර ප්‍රජාවද තවදුරටත් සිරකරුවන්ගේ අයිතීන් සුරකීම උදෙසා තව තවත් ජාත්‍යන්තර සම්මුතීන් සහ ජාත්‍යන්තර යෝජනා ඉදිරිපත් කළයුතුය.

## ශ්‍රී ලංකාව තුළ සිරකරු අයිතීන් වල ස්වභාවය

බන්ධනාගාර කිරීම හරහා බලාපොරොත්තු වනුයේ පුද්ගලයෙකු පීඩාවට පත් කිරීම නොවෙයි. එමෙන්ම බන්ධනාගාර යනු වධකාගාරද නොවිය යුතුය. ජාත්‍යන්තර ප්‍රජාව විසින් සිරකරුවන් ඉලක්ක කොටගෙන අයිතීන් රාශියක් හදුන්වා දී ඇත, ඉන් ඇතැම් අයිතීන් සුරැකීමට ශ්‍රී ලංකාවද බැදී සිටියි.

මෙරට බන්ධනාගාර තුළ දක්නට ලැබෙන කණගාටුදායකම තත්වයක් වනුයේ රැදවියන්ට ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීමයි. එසේම ප්‍රමාණවත් පරිදි ජල පහසුකම්, වැසිකිළි පහසුකම් සහ ඇදන්, පිගන් කෝප්ප, තුවා, ඇදුම් ආදී අනෙකුත් අත්‍යාවශ්‍ය දෑ වල හිගකම නිසාවෙන් රැදවියන්ට නොයෙකුත් දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවෙයි.

මෑත කාලීනව සමාජය තුළ සිරකරුවන් සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු වූයේ නැවත වරක් මරණ දණ්ඩනය ක්‍රියාත්මක

[11]Article 2(2)(c) of the Forced Labour Convention

[12]Article 2(1) of the Forced Labour Convention, 1930 (No 29) defines forced or compulsory labour

[13]https://www.newlawjournal.co.uk/content/forced-labour

MANURAWA2020

©All rights reserved

කිරීමට යෝජනා කිරීම හරහාය. ශ්‍රී ලංකාව තුළ අවසන් වරට පුද්ගලයෙකු එල්ලා මරණ ලද්දේ වර්ෂ 1976 ජුනි මස 23 දිනය, ඉන්පසු මෙරට කිසිදු බන්ධනාගාරයක් තුළ මරණ දණ්ඩනය ක්‍රියාත්මක වූ බවට තොරතුරු සඳහන් නොවෙයි.

සෑම පුද්ගලයකුටම උපතින්ම උරුමවන්නා වූ අයිතීන් සමූහයක් ලෙසට මානව අයිතීන් පෙන්වා දිය හැකිය. ශ්‍රී ලංකාව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් එකී අයිතීන් සුරක්ෂිත කොට බලාත්මක කර පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදය තුළ 10 සිට 17 දක්වා ව්‍යවස්ථා අටකට ගොනු කොට එම අයිතීන් සඳහන් කර ඇත. ඉන් අයිතීන් දෙකක් කිසි ලෙසකටත්, කවර ආකාරයකටවත්, කවර පදනමක් යටතේ හෝ සීමා කළ නොහැකි අයිතීන්වෙයි. (ව්‍යවස්ථා 10 සහ ව්‍යවස්ථා 11). එයට අමතරව පුරවැසියන්ට පමණක් සීමාවන අයිතීන්ද වෙයි ව්‍යවස්ථා 12(2) සහ ව්‍යවස්ථා 14(1) එයට උදාහරණ වෙයි.

යම් අකාරයකින් මෙම මූලික අයිතීන් විධායකයේ හෝ පරිපාලනයේ ක්‍රියාවක් හේතුවෙන් උල්ලංඝණය වූ විටක හෝ ඊට ආසන්න තත්වයකට පැමිණි විටෙක, එකී අවස්ථාවේ සිට මසක කාලයක් ඇතුලත ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරීම සිදු කළ යුතුය.

උක්ත සඳහන් 10 සහ 11 ව්‍යවස්ථාවල සඳහන් අයිතීන් කවර පදනමක් යටතේ හෝ සීමා කළ නොහැකිය. 10 වන ව්‍යවස්ථාවේ සඳහන් වනුයේ ඕනෑම පුද්ගලයෙකුට තමන් අභිමත ආගමක් ඇදහීමට, වැළඳගැනීමට ඇති නිදහසද, ලබ්ධියක් හෝ විස්වාසයක් දැරීමේ පිළිගැනීමට ඇති නිදහස, සිතීමේ නිදහස, හෘදය සාක්ෂිය නිදහස සහ ආගමික නිදහස යන අයිතීන් වෙයි. එසේම 11 වන ව්‍යවස්ථාව අනුව කිසිදු තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික, අවමන් සහගත සැලකිල්ලට නැතහොත් දඬුවමට ලක් නොකළ යුතුය.

මේ අනුව අපට පැහැදිලිව පෙනී යන කරුණක් වනුයේ මෙම 10 සහ 11 ව්‍යවස්ථාහිසඳහන් අයිතීන් බන්ධනාගාරගත රැඳවියන්ටද අදාල වන බවයි. මන්දයත් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එලෙසින්ම සඳහන් නොවුනද එකී අයිතීන් කිසිදු ව්‍යතිරේඛයකට යටත් නොවන නිසාවෙන් එම අයිතීන් භුක්ති විඳීමට සිරකරුවන්ටද හැකිවෙයි. ඒ අනුව කිසිදු රැඳවියෙකු වධහිංසාවලට හෝ කවර ආකාරයක කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකටලක් නොකළ යුතුය. බන්ධනාගාර භාරයේ සිටින රැඳවියන්ට නිළධාරීන් කරන පහරදීම්, වධහිංසා කිරීම් ආදිය මෙම ව්‍යවස්ථා අනුව නීති විරෝධි වෙයි. එලෙස නිළධාරීන් විසින් කායික බලය යෙදිය හැකි වනුයේ අත්අඩංගුවෙන් මිදී පලා යාම වැලැක්වීමට හෝ පුද්ගලික ආරක්ෂාවේ අයිතිය සඳහා පමණක් වෙයි.

එසේම 12(2) ව්‍යවස්ථාව සහ 14(1) ව්‍යවස්ථාවන් හි සඳහන් අයිතීන් සෑම පුවැසියෙකුටම කිසිදු භේදයකින් තොරව භුක්ති විඳිය හැකි අයිතීන් වෙයි. යමෙකු බන්ධනාගාරගත වූ පමණින් ඔහු හෝ ඇයගේ පුරවැසිභාවය අහිමි නොවෙයි. එසේහෙයින් එකී ව්‍යවස්ථාවන්හි සඳහන් අයිතීන්ද සමාජයේ අනෙක් පුරවැසියන් මෙන්ම භුක්ති විඳීමට බන්ධනාගාරගත රැඳවියන්ටද හැකියාව පවතී. 12(2) ව්‍යවස්ථාවට අනුව කිසිදු පුරවැසියෙකුට සිය වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂභාවය, දේශපාලන මතය සහ උපන් ස්ථානය ආදී කරුණු මත කිසිදු වෙනස්කමකට හෝ විශේෂයකට ලක් නොකළ යුතුය. මෙම අයිතිය නිසාවෙන් බන්ධනාගාරය තුළදී ඕනෑම තරාතිමක පුද්ගලයෙකු එකසේ සැලැකීමට ලක් වෙයි.

ව්‍යවස්ථා 14(1)(ඉ) සඳහන් වනුයේ ආගමික නිදහසේ භෞතික කොටසයි. එනම් ප්‍රයෝගික චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ අයිතීන්ය. ඒවාද කිසිදු ආකාරයක සීමා කිරීමකට යටත් කළ නොහැකිය. මෙරට බන්ධනාගාර තුළ විවිධ ආගම් සහ ජාතීන්ට අයත් රැඳවියන් සිටියි.
බෞද්ධ, කතෝලික, හින්දු, ඉස්ලාම් ආදී ආගම් අදහන රැඳවියන් වෙනුවෙන් බන්ධනාගාර පරිශ්‍ර තුළ ඒ එක් එක් ආගම්වලට අදාලව වන්දනා මාන කිරීමට පහසුකම් සපයා ඇත. එයට අමතරව ඇතැම් බන්ධනාගාරයන්හි දහම් පාසල්ද ස්ථාපනය තර ඇත. තවද එකී

MANURAWA 2020

©All rights reserved

ආගම්වලට අදාලව සමරුනු ලබන ආගමික උත්සව ආදිය සැමරීමටද රැදවියන්ට ඉඩ ප්‍රස්තාව හිමි වෙයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13වන ව්‍යවස්ථාව අනු කොටස් හතකට බෙදා ඇත. එහි සඳහන් වනුයේ  අපරාධ වරදකට සැකපිට අත්අඩංගුවට පත් වූ අයෙකුට හිමිවන අයිතිවාසිකම් පිළිබඳවය. මෙම අයිතීන් නීතියේ නිසි ක්‍රියාදාමයට අදාල මූලික අයිතීන් ලෙසටද හඳුන්වයි. 13(1) ව්‍යවස්ථා ප්‍රකාරව, යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලබයි නම් එය නීතිය මගින් නියම කරන ලද කාර්යය පටිපාටියට පමණක් සිදුවිය යුතුය. එසේම අත්අඩංගුවට ගැනීමට හේතුවද සැකකරුට දැනුම් දිය යුතුය.

13(2) ව්‍යවස්ථාව අනුව යමෙකු රදවා තබාගන්නේ නම් ඒ සඳහා අනුගමනය කළ යුතු මූලික පියවරයන් කීපයක් වෙයි. ඒ අනුව සිරභාරයට ගත් සෑම තැනැත්තෙකුම ආසන්නම නිසි අධිකරණයේ විනිසුරු හමුවට ගෙන යා යුතුය. පොලිස් අත්අඩංගුවේ සාමාන්‍යයෙන් පැය 24 ක කාලයක් රදවා තබා ගත හැකිය. තවදුරටත් එලෙසරදවා තබා ගැනීමට අධිකරණ නියෝගයක් අත්‍යාවශ්‍ය වෙයි.

එමෙන්ම 13(3) ව්‍යවස්ථාව පරිදි සාධාරණ නඩු විභාගයකට හෙවත් සාධාරණ විනිශ්චයකට සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත. මෙහිදී චූදිත තැනැත්තාට පුද්ගලිකව මෙන්ම නීතිඥයෙකු මාර්ගයෙන්  කරුණු කියා පෑමට හැකිය.

13(2) 13(4) ව්‍යවස්ථාව රැඳවියන්ට බෙහෙවින්ම වැදගත් එකකි. එහි සඳහන් වනුයේ අත්තනෝමතික දණ්ඩනයෙන් නිදහස් වීමට මිනිසුන්ට අයිතියක් ඇති බවයි. යම් තැනැත්තකුට දඩුවම් කරන්නේ නම් එසේ කළහැකි වනුයේ නීතියෙන් නියම කළ කාර්යය පටිපාටියට අනුව පමණකි, තවද යමෙකු මරණ දඩුවමට හෝ බන්ධනාගාර ගත කිරීමට හැකියාව පවතිනුයේ  නිසි අධිකරණයක ගරු විනිසුරුතුමන් විසින් කරන ආඥාව මත පමණකි.

එසේම  එහි වැඩිදුරටත් සඳහන් වනුයේ නඩු විභාගය අවසන් වන තුරු හෝ විමර්ශන කටයුතු අවසන් වන තෙක් යමෙකු රක්ෂිත බන්ධනාගාරයේ  තැබීම දඩුවමක් ලෙස නොසලකා කටයුතු කළ යුතු බවයි. 13(5)ව්‍යවස්ථාවද මෙයට සමගාමී අයිතියක් ලෙස පෙන්වා දිය හැකිය. එනම් වරදකරු යැයි ගරු අධිකරණයෙන් තීන්දු කරනු ලබන තෙක් සෑම පුද්ගලයෙකුම නිර්දෝෂීයැයි පූර්ව නිගමනය කළ යුතු බවයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(6) වන ව්‍යවස්ථාව සඳහන් වන්නේ අතීතයට බලපාන ආකාරයට දණ්ඩන නීති පැනවිය නොහැකිය යන්නයි. මෙය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය, එනම්

1. යම් ක්‍රියාවක් සිදුකළ අවස්ථාවේ එය වරදක් නොවෙයි නම් පසුව නීති සම්මත කොට  ඒවා අතීතයට බලපවත්වා එම සිදුකළ ක්‍රියාව වරදක් ලෙස සැලකිය නොහැකි වෙයි.

2. යම් වරදකාරී ක්‍රියාවක් සිදුකළ අවස්ථාවේ එයට අදාළ දඩුවමට වඩා වැඩි දඩුවමක් පසු අවස්ථාවකදී නියම කළ නොහැකිය.

මෙය රැදවියන්ට අතිශය වැදගත් අයිතියක් වෙයි. මන්දයත් යම් වරදකට දැනටමත් ඔවුන් දඩුවමක් අත්විඳින අතරතුර එකී වරදට අදාළ දණ්ඩනය පසුව වෙනස් වුවද ඔවුන්ට එරෙහිව එම නව දණ්ඩනය ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොපවතී.

කෙසේ නමුත් 13(6) ව්‍යවස්ථාවට ව්‍යතිරේඛ අවස්ථා පවතී. ජාත්‍යන්තර නීතිය යටතේ යම් ක්‍රියාවක් සාපරාධි ක්‍රියාවක් වන විටදී වරදකරුට මෙම අයිතිය යටතේ සහනයක් ලබා ගත නොහැකිය. සේපාල *ඒකනායක එදිරිව රජය* නඩුව මෙවැනි අවස්ථාවකට උදාහරණ සපයයි.

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

## සිරකරුවන් සතු ඡන්ද අයිතිය

ඡන්දය භාවිතා කිරීමේ අයිතිය අතිශය වැදගත් අයිතියක් වෙයි. එය හුදෙකලා අයිතියක් නොවෙයි, එය අනෙකුත් අයිතීන් කීපයක් සමග සහසම්බන්ධ වෙයි. විශේෂයෙන්ම යුක්තිය සහ සාධාරණත්වය ආදී සංකල්පවලට මනා පිටිවහලක් වෙයි. පුරවැසියන් නොවන තැනැත්තන්ට එය අහිමි කිරීම තර්කානුකුලය, නමුත් සිරකරුවන්ට එම අයිතිය අහිමි කිරීම කෙතරම් යුක්ති සහගතද?

ශ්‍රී ලංකාව තුළ සිරකරුවන්ට ඡන්ද අයිතිය අහිමි වුවද, ලෝකයේ ඇතැම් රටවල රැඳවියන්ට සිය ඡන්දය භාවිතා කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කොට ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත 48 කද, ඉන්දුනීසියාව, දකුණු අප්‍රිකාව, කැනඩාව සහ කෙන්යාව ආදී රටවල් කීපයකම රැඳවියන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දී ඇත. තවද ඇලබාමා, මිසිසිපි සහ ඇල්ජීනියාව ආදී ප්‍රන්තවලවරදකරුගේ වරදේ ස්වභාවය මත පදනම්ව ඇතැම් රැඳවියන්ට සිය ඡන්දය භාවිතා කිරීමට අවස්ථාව ලබා දී ඇත.

සිරකරුවන්ටද මෙම අයිතිය ලබා දීම වැදගත් වෙයි. එමගින් ඔවුන්ට ඔවුන් වෙනුවෙන් හඬක් නැගීමට අවකාශය උදා වෙයි. බොහෝ විටෙක මෙම අයිතිය සිරකරුවන්ගෙන් අහිමි කිරීමට හේතු පාදකවූයේ සෑම සිරකරුවෙකු දෙසම පොදු කෝණයකින් බැලීම නිසාවෙනි.

භාෂණයේ නිදහස, ආගමික නිදහස, නීතිය ඉදිරියේ සමානාත්මතාවය, කෲර සහ අමානුෂික වද හිංසනයන්ට ලක් නොවීමට ඇති අයිතිය ආදී අයිතීන් ඔවුන්ට හිමි වීමත් අනෙක් අතට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඔවුන්ට අහිමි වීමත් පදනම් විරහිතය. මෙය ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණවලට පටහැණි වෙයි.

සිරකරුවන්ගේ මතය විමසීම වැදගත් වෙයි. වෙසසින්ම අපරාධ යුක්තිය පසඳලීමේ ක්‍රියාවලියට එය උපකාර වෙයි. පුරවැසියන්ගේ මතවාදය ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයකට අතිශය වැදගත් වෙයි. ප්‍රජාතන්ත්‍රවාදය රඳා පවතිනුයේ සියලු පුරවැසියන් සමාන අයිතිවාසිකම් හිමිවිය යුතුය යන පදනම මතය.

## නිගමනය

යමෙකුට ගොඩනැගිය හැකි තර්කයක් වනුයේ සිරකරුවන් යනු යම් අධිකරණයක් මගින් වරදකරුවෙකු බවට තීන්දු කර ඊට අදාලව නිසි දඬුවම් පැමිණවූ පුද්ගලයින් බැවින් ඔවුනට මෙවැනි අයතිවාසිකම් ලබාදීම කෙතරම් ප්‍රායෝගිකද යන වගයි. ඒත් සමගම අනෙක් අතට නැගෙන තර්කය නම් අපරාධ පරීක්ෂණවල ඇති නිර්වද්‍යතාව, නඩු විභාගය තුළ සිදුවිය හැකි දෝෂ, සාක්ෂි ඉදිරිපත් කිරීමේදී සිදුවන අඩුපාඩු ආදිය නිසා ඇතැම් විටක නිර්දෝෂී පුද්ගලයෙකු වුවද වරදකරුවෙකු ලෙස සිරගත විය හැකි බවයි. එවැනි සිදුවීම් මින් පෙර අවස්ථා කීපයකම සිදුව ඇත. ඇතැම් නිර්දෝෂි පුද්ගලයන් මරණ දණ්ඩනයට පවා ලක්ව ඇත.

නූතන බන්ධනාගාර ප්‍රධාන වශයෙන් කාර්යයන් දෙකක් ඉටුකරයි. එනම් යුක්තිය පසඳලීමේ ක්‍රියාවලියට සහය දැක්වීම සහ රැඳවියන් පුනරුත්තාපනයට ලක් කිරීමේ ක්‍රියාවලියයි. සියවසකට අධික කාලයක් ගතව තිබුණද නූතන බන්ධනාගාර ක්‍රමය හරහා බලාපාරොත්තු වූ අභිලාෂයන් ඉටු කර ගැනීමට සමත් වී ඇත්ද යන්න ප්‍රශ්න සහගතය.

විශේෂයෙන්ම අද වන විට වෙනත් අභියෝග රාශියකට මුහුණ පෑමට ලොව පුරා බන්ධනාගාරවලට සිදුව ඇත. ඒ අතරට පසුගිය දශක කිහිපය තුළ ජාත්‍යන්තර ප්‍රජාවගේ වැඩි අවධානයක් යොමු වූ මාතෘකාවක් වන මානව හිමිකම්ද මෙයට අයත් වෙයි.

යදමින් බැද සිරකොට තැබුවද සිරකරුවන්ද මනුෂ්‍යයන්ය, ඔවුනටද හිමිකම් පවතී. එකී හිමිකම් සුරකීමට බොහෝ පියවර ගෙන තිබුණද, එකී පියවර සාධනීයද යන්න නැවත විමසිය යුතු කරුණකි. එනම් අවසනයේ පැමිණිය හැකි නිගමනය නම් රැඳවියන් පුනරුත්තාපනය කිරීමට මත්තෙන් බන්ධනාගාර ක්‍රමවේදය පුනරුත්තාපනය කළ යුතුය යන්නයි.

MANURAWA 2020

©All rights reserved